ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | **සන්නිවේදන දෙපාර්තමේන්තුව** |
| දිනය | **2017 මැයි 12** |

## මහ බැංකු අධිපති විසින් කළ ප්‍රකාශ සම්බන්ධයෙන් පළ වූ සාවද්‍ය මාධ්‍ය වාර්තා පිළිබඳ ව ශ්‍රී ලංකා මහ බැංකුවේ පැහැදිලි කිරීම

2017 මැයි 09 වැනි දින ශ්‍රී ලංකා මහ බැංකු මූලස්ථානයේ දී පැවැති ප්‍රවෘත්ති සාකච්ඡාවක දී මහ බැංකු අධිපති ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා විසින් සිදු කරන ලද ප්‍රකාශයක් සම්බන්ධයෙන් ඇතැම් මාධ්‍යවල පළ වූ සාවද්‍ය වාර්තා කීපයක් වෙත මහ බැංකුවේ අවධානය යොමු වී ඇත. අවිධිමත් ගනුදෙනු හරහා සේවක අර්ථසාධක අරමුදලට පාඩු සිදු කළ  බවට චෝදනා එල්ල වී ඇති මහ බැංකුවේ සහකාර අධිපතිවරයෙකු සහ අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු/නිලධාරීන් මාරු කළ බව මහ බැංකු අධිපති විසින් ප්‍රකාශ කර ඇතැ යි ඉහත සඳහන් පුවත්පත් වාර්තාවල සඳහන් වේ.

ඒ අනුව, එම පුවත් වාර්තාවල පළ වී තිබූ සාවද්‍ය කරුණු සම්බන්ධ ව ශ්‍රී ලංකා  මහ බැංකුව විසින් පහත ප්‍රකාශය නිකුත් කරනු ලැබේ.

2013 – 2016 කාලය තුළ සේවක අර්ථසාධක අරමුදල විසින් රාජ්‍ය සුරැකුම්පත්වලට අදාළ ව සිදුකරන ලද ගනුදෙනු පිළිබඳ ව පරීක්ෂා කිරීමට අභ්‍යන්තර කමිටුවක් මහ බැංකු මුදල් මණ්ඩලය විසින් පත් කරන ලදී. එම පරීක්ෂණයේ මූලික අවධානය අදාළ ගනුදෙනු පිළිබඳ ව යොමු කෙරුණු අතර, එහි දී කිසිදු නිලධාරියෙකුගෙන් පැහැදිලි කිරීම් ලබා ගෙන නො තිබුණි. එම පරීක්ෂණයේ මූලික අනාවරණයන් සලකා බලා, මහ බැංකු අත්පොතට අනුව තවදුරටත් පරීක්ෂණ සිදුකිරීමට සහ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හට තම පැහැදිලි කිරීම් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් දීමට සහකාර අධිපතිවරයෙකු වැඩිදුර පරීක්ෂණ සඳහා පත් කිරීමට මුදල් මණ්ඩලය තීරණය කරන ලදී.

එම වැඩිදුර විමර්ශනයට පසුව එහි නිගමන සලකා බලා මුදල් මණ්ඩලය විසින් තවදුරටත් අවශ්‍ය පරීක්ෂණ සිදු කිරීමට ස්වාධීන පරීක්ෂණ කමිටුවක් පත් කරනු ඇත.

මෙම වසර තුළ, මහ බැංකුවේ අභ්‍යන්තර කාර්යය පටිපාටීන්ට අනුව සේවක පත්වීම් හා නිලධාරීන්ගේ රාජකාරි කටයුතු මාරු කිරීම් සිදු කරන ලද අතර, සේවක අර්ථසාධක අරමුදලට සම්බන්ධ විමර්ශනයන්හි දී අනාවරණය වූ කරුණු පදනම් කරගෙන කිසිදු මහ බැංකු නිලධාරියෙකු සේවා මාරු කිරීමකට යටත් කර නොමැත.

අදාළ වැඩිදුර විමර්ශන කටයුතුවල දී යම් වරදක් සිදුකර ඇති බවට කරුණු හෙළි වුවහොත් මහ බැංකු අත්පොතට අනුව, ඕනෑම නිලධාරියෙකුට එරෙහි ව විනය ක්‍රියාමාර්ග ගනු ඇත.

යම් කිසි වැරදි ක්‍රියාවක් සිදුකර ඇති බවට අදාළ පරීක්ෂණ මඟින් අනාවරණය වුවහොත් එම කරුණු නීතිය ක්‍රියාත්මක කරන ආයතන වෙත යොමු කිරීමට ද අවශ්‍ය පියවර ගනු ඇත.